# 11 - ශ්‍රේණිය
# පළමු වාර පරීක්ෂණය 2024
## පිළිතුරු පත්‍රය

## I පත්‍රය

| | | | | |
|---|---|---|---|---|
| 01. 02 | 02. 03 | 03. 02 | 04. 04 | 05. 04 |
| 06. 01 | 07. 01 | 08. 01 | 09. 04 | 10. 02 |
| 11. 04 | 12. 03 | 13. 04 | 14. 03 | 15. 01 |
| 16. 04 | 17. 03 | 18. 03 | 19. 03 | 20. 02 |
| 21. 03 | 22. 02 | 23. 01 | 24. 04 | 25. 03 |
| 26. 02 | 27. 02 | 28. 01 | 29. 02 | 30. 01 |
| 31. 04 | 32. 03 | 33. 03 | 34. 03 | 35. 02 |
| 36. 04 | 37. 04 | 38. 01 | 39. 01 | 40. 01 |

## II පත්‍රය

01.

I. චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලන්පස

II. සමගි වන්න, විවාද නොකරන්න. (10 ශ්‍රේණිය, 11 පාඩම පිටු අංකය 62)

III. ගරුක කර්ම, ආසන්න කර්ම, ආචින්න කර්ම, කටත්තා කර්ම

IV. බරණැස ඉසිපතනය - පස්වග මහණුන්ට

V. ඡන්ද, ද්වේශය, භය, මෝහය

VI. කාමසුඛල්ලිකානු යෝගය
අත්තකිලමතානු යෝගය

VII. මහියංගන ස්තූපයේ ධාතු ගර්භය, දිඹුලාගල ලෙන, තිවංක පිළිමගෙය පිළිතුරු අතරින් දෙකක්

VIII. වෙස්සන්තර ජාතකය, සිවි ජාතකය, සස ජාතකය මින් එකක්

IX. නිබද්ධ චාරිකා

X. කණිෂ්ක ධර්ම සංගයානාව/ සර්වාස්තිවාදී ධර්ම සංගායානාව

02.

I. නොහික්මුණු පිරිස් හික්මවා ගැනීමේ ගුණය

II. අංගුලිමාල දමනය, ආලවක දමනය, සුචිරෝම බරරෝම යක්ෂ දමනය, සච්චක දමනය, උපාලි ගෘහපති දමනය,ජටිල දමනය, නාලාගිරි දමනය (11 ශ්‍රේණිය 02 පාඩම 13 පිටුවේ ඇති පිළිතුරු අතරින් තුනක්)

III. බුදුරජාණන් වහන්සේ තුළ පැවැති අසීමිත ගුණ සමුදාය අතරින් (ඉතිපිසෝ ගාථාව ඇසුරෙන් හෝ 11 ශ්‍රේණිය පෙළ පොතේ ඇති ගුණ අතරින්) කරුණු 03 ක් උදාහරණ වශයෙන් ගෙන ඒවා අපගේ ජීවිතයට යා කරගත හැකි ආකාරය ගලපා තිබේනම් පිළිතුර සමස්ථයක් සේ සලකා ලකුණු ලබා දෙන්න.

03.

I. අත්තනාව කතං පාපං
අත්තනා සංකිලිස්සති
අත්තනා අකතං පාපං
අත්තනාව විසුජ්ඣති
සුද්ධි අසුද්ධි පච්චත්තං
නාඤ්ඤෝ අඤ්ඤං විසෝධයේ

II. යමෙකු පව් කළොත් එයින් ඔහුම කෙලෙසෙන්නේ ය. යමෙකු පව් නොකළොත් එයින් ඔහු ම පිරිසිදු වන්නේ ය. පිරිසිදුකම හා අපිරිසිදුකම පවතින්නේ තමා කෙරෙහි ම ය. එක් අයෙකුට තවත් අයෙකු පිරිසිදු කළ නොහැකි ය.

III. සූත්‍ර පිටකයේ ඛුද්දක නිකායට අයත් ධම්මපදය ගාථා 423 ක් හා වග්ග 26 කින් යුක්තය. බාල මහළු ලොකු කුඩා සියලු දෙනාට පරිහරණය කළ හැකි වටිනා උපදෙස් ග්‍රන්ථයක් වන ධම්මපදය පුද්ගල ජීවිතය සාර්ථක කර ගැනීමට අවශ්‍ය උපදෙස් ඇතුලත් ය. ජාති ආගම් භේදයකින් තොරව සමස්ථ මානව වර්ගයාටම ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවිය හැකි ධර්ම කරුණු අඩංගුය........ නිදසුන් දෙකක්වත් දක්වමින් පිළිතුර ගලපා තිබේ නම් පිළිතුර සමස්ථයක් සේ සලකා ලකුණු දෙන්න.

04.

I. "දානං සීලං ච නෙක්ඛම්මං
පඤ්ඤා විරියේන පංචමං
ඛන්ති සච්චමධිට්ඨානං
මෙත්තුපෙක්ඛාතිමේ දස"

II. පාරමී, උපපාරමී, පරමත්ථ පාරමී

III. පාරමිතා හැඳින්වීම, දාන සීලාදී ගුණ ධර්මවලින් යුතු සදාචාරවත් පැවතුම් ජීවිතයට එක් කර ගැනීම ආදී කරුණු 03 ක් වත් යටතේ උදාහරණ සහිතව පිළිතුරු ලියා ඇත්නම් සම්පූර්ණ ලකුණු දෙන්න. (11 ශ්‍රේණිය 03 පාඩම පරිශීලනය කරන්න.)

05.

I. කුසල් දහම් වැඩි දියුණු කරන මානසික අභ්‍යාසය භාවනාවයි.

II. කුසල් අරමුණුක සිත එකඟ කරන භාවනාව චිත්ත භාවනාව හෙවත් සමථ භාවනාව ලෙස හැඳින්වේ. "සමථය යනු සංසිඳුවීමයි, සංවර කිරීමයි. සාමදාන කිරීම යන්නයි. ඒ අනුව සිත දූෂණය කරන කෙලෙස් සතුරන් සංසිඳුවීමත්, කුසල් සිත් දියුණු කිරීමෙන් සිත දියුණු කිරීමත් මෙම භාවනාවෙන් සිදු කෙරෙයි.
ආචාර්යවරයෙකුගේ මග පෙන්වීම ආශ්‍රිතව කමටහන් ලබාගෙන ඉන්ද්‍රිය සංවරයෙහි පිහිටා මනා සිහියෙන් යුතුව වඩන භාවනාවෙන් හෝ සිත සමාධිගත කරගත හැකිය. සමථ භාවනාවේ උසස් ඵල ලෙස පංචාභිඥ අෂ්ට සමාපත්තිය ලබා ගත හැකිය.

III. පුද්ගල ජීවිතයේ සාර්ථකත්වය සඳහා භාවනාව උපයෝගි කරගත හැකිය. ඉගෙනීමෙහි පසුබට වන්නේ සිත දුර්වල බැවිනි. ජීවිතයේ ඕනෑම ගැටලුවක් ජය ගැනීමට චිත්ත ඒකග්‍රතාවය තිබිය යුතුයි. විවිධ හේතු හදමින් පසුබට වන ශිෂ්‍යයන්ට තමන්ගේ සිත හඳුනාගැනීමට හැකි නම් සිත ශක්තිමත් කරගත හැකියි. භාවනාව තුලින් ලොභ, ද්වේශ, මෝහ ආදි සිතුවිලි පාලය වේ. මතක ශක්තිය වැඩි දියුණු වේ. පොත පත පාඩම් කිරීමේදි වෙනදාට වඩා පහසුවක් දැනේ. කායික රෝග පීඩා අඩුවීමෙන් නිරෝගිකම ඇතිවේ. සිත විවිධ අරමුණුකරා දිව නොයයි. මේ ආදි හේතු නිසා අධ්‍යාපනයෙහි වැදගත්කම මතු කරගෙන පොත පත පාඩම් වැඩවලට සිත යොමා දක්ෂතාව වර්ධනය වන ආකාරයට පිළිතුර ගලපා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

06.

I.

- කුපික්කල තිස්ස හිමියන්ට අභයගිරිය කරවා පූජා කිරීම
- අභයගිරි පාර්ශවයට හිතවත්ව කටයුතු කළ ධර්ම රුචි තෙරුන් වහන්සේගේ ඉගැන්වීම ථෙරවාදී බුදු දහමට පටහැනි වීම. වළගම්බා රජ සමයේ බලපෑ සාගතය නම් දොළොස් අවුරුදු නියතය නිසා ධර්මධර භික්ෂූන් වහන්සේලා අපවත් වීම.
- දීර්ඝ කාලීන යුද වාතාවරණය බුදු දහමේ පැවැත්මට බාධාවක් වීම.
- භික්ෂූන් වහන්සේලා ශාසනික පිළිවෙතින් පිරිහියාම.
- භික්ෂූන් වහන්සේ ග්‍රන්ථ ධූරය වැඩීමත් සමඟ ත්‍රිපිටකය ලේඛනාරූඪ කිරීමේ අවශ්‍යතාවය

II. පැවැත්වූ ස්ථානය - මාතලේ අළු විහාරයේ ආලෝකාලෙන විහාරය
මූලිකත්වය - ප්‍රාදේශීය පාලකයෙක්
භික්ෂූන් වහන්සේ සංඛ්‍යාව - පන්සීයයි.

III.

- මුඛ පරම්පරාගතව පවතින ත්‍රිපිටක ධර්මය කාලයක් යන විට වෙනස් වීමට ඉඩ තිබුණි. ලේඛනගත වීම නිසා ධර්මයේ සුරක්ෂිතතාව ඇති වූ බව
- බටහිර රටවලට බුදු දහම බෙදාහැරීමට ලේඛන ගතවීම වැදගත් බව
- ථේරවාද බුදු දහම අභාවයට ගිය කලක නැවත ස්ථාපිත කිරිමට ලේඛන ගත වීමට වැදගත් බව
ආදි වශයෙන් ධර්ම විනයේ සුරක්ෂිත බවට කරුණු ලියා ඇත්නම් පිළිතුර සමස්ථයක් සේ සලකා ලකුණු දෙන්න.

07.

I. **රේරුකානේ චන්දවිමල නා හිමි**.

- රයිගම කෝරලයේ රේරුකාන ගමෙහි උපත ලද රුබෙල් ගුණවර්ධන කුමරු බුරුම ජාතික යූ. විනයාලංකාර හිමියන් වෙතින් රේරුකානේ චන්ද විමල නමින් පැවිදි වීම.
- බුරුම රටට වැඩම කොට ත්‍රිපිඨකය ඉගෙනීම හා එහිදීම උපසම්පදාව ලබා පසුව මෙරටට පැමිණි බව
- චාම් සරල අල්පේච්ඡ ජීවිතය ප්‍රියකළ බව
- බෞද්ධයාගේ දහම් දැනුම වැඩි කිරීමට උදව් වන ධර්ම ග්‍රන්ථ සම්පාදනය කළබව
- 1997 ජූලි 04 දින අපවත් වූ බවත් ආදාහන කටයුතු චාම්ව කළ බවත්..... කරුණු ඇතුළත් විය යුතුයි.
පිළිතුර සමස්ථයක් සේ සලකා ලකුණු දෙන්න

(11 ශ්‍රේණිය පෙළපොතේ (05) ආදර්ශවත් චරිත පාඩම පරිශීලනය කරන්න.)

II. **සඳකඩ පහන**

- බෞද්ධ සිද්ධස්ථානයකට හෝ රාජකීය ගොඩ නැගිල්ලකට පිවිසෙන පියගැට පෙළ පාමුල පිහිටි අර්ධකවාකාර ගල්පුවරුව බව
- කලාත්මකම නිර්මාණය අනුරාධපුර බිසෝමාලිගාව අසල ඇති බව
- විසිතුරු කැටයම් හා එම කැටයම් වලින් සංසාර චක්‍රය පෙන්වන බව විද්වතුන් දක්වා ඇති බව
- අනුරාධපුර හා පොලොන්නරු සඳකඩපහනෙහි වෙනස්කම් ඇති බව.... ආදී කරුණු ඇතුලත් විය යුතුයි.

(10 ශ්‍රේණිය 20 පාඩම පරිශිලනය කරන්න. පිළිතුර සමස්ථයක් සේ සලකා ලකුණු දෙන්න.)

III. **අපරාපරීය වේදනීය කර්මය**
අපරාපරීය වේදනීය කර්මය යනු දෙවන ආත්භාවයෙන් පසු කවර හෝ ආත්ම භාවයක දී විපාක දෙන කර්මය. සසර දුකින් නිදහස්ව නිවන් දක්නා ජාති දක්වා යම් කිසි භාවයකදී විපාක ලබා දීමට එම කර්ම සමත් වෙයි.

IV. **බුදු ගුණ බව**
වර්තමාන ලෝකයේ විවිධ අපචාරයන්ට හේතු වී ඇත්තේ මිනිසුන්ගේ කාර්ය බහුලතාවය නිසාම විසුරුණු කළබල සහිත සිතුවිලිය. මේ නිසා කළ යුත්ත නිවැරදිව නොපෙනේ. විසුරුණු මනස සන්සුන් කිරීමට උපකාරී වන සමථ භාවනාවට අයත් බුද්ධානුස්සතිය හෙවත් බුදු ගුණ භාවනාව වැඩීමට පහසුය. බුදු රජාණන් වහන්සේගේ නව අරහාදී බුදු ගුණ ඇසුරෙන් බුදු ගුණ භාවනාව වඩන අතර බුදු ගුණ ඇසුරෙන් එක් ගුණයක් ගෙන එම බුදු ගුණය අර්ථ සහිතව මෙනෙහි කරමින් භාවනාව වැඩිය හැකිය. සෑම දිනකම වැඩිය හැකි භාවනාවකි.
(10 ශ්‍රේණිය 04 පාඩම පරිශිලනය කරන්න. පිළිතුර සමස්ථයක් සේ සලකා ලකුණු දෙන්න.)